**දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය - 2013**

-----------------------------------------------------------------------

දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2007 දෙසැම්බර් 18 දින එළැඹි ණය අංක 2371 එස්ආර්අයි (එස්එෆ්) සහ ප්‍රදාන අංක 0091-එස්ආර්අයි(එස්එෆ්) දරන ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.02 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------

දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතියේ ණය සහ ප්‍රදාන ගිවිසුම්වලට අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. උගත් තරුණයින්ගේ රැකියා, නියුක්තිය වැඩිකිරීම ප්‍රතිඵල ගන්වන ශ්‍රම වෙළෙඳ පොළ අවශ්‍යතාවලට ද්විතීය හා තෘතීයික අධ්‍යාපනයේ අදාළත්වය වැඩිකිරීම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත බලපෑම වේ. ද්විතීයික හා තෘතීයික අධ්‍යාපනය සඳහා ගුණාත්මකභාවය, අදාළත්වය, ඵලදායීත්වය සහ සමානව ප්‍රවේශවීම වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵලය වේ.

ණය සහ ප්‍රදාන ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 11,267 කට සමාන එජඩො මිලියන 105 ක් විය. එයින් රු. මිලියන 6,955 කට සමාන එජඩො මිලියන 65 ක් ණය මුදලක් ලෙසත්, රු. මිලියන 1,605 කට එජඩො 15ක් සමාන ප්‍රදානයක් ලෙසත් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2008 මාර්තු 07 දින ආරම්භ කරන ලද අතර 2013 ජූනි 30 වන විට නිමකිරීමට නියමිතව තිබුණි. 2012 මාර්තු 16 දිනැති ආසියානු සංවර්ධන බැංකු මෙමෝ පත අනුව ව්‍යාපෘතිය නිමකිරීමේ දිනය 2014 ජූනි 30 දින දක්වා දීර්ඝ කර තිබුණි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

-----------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ

හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍යයැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂාකිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියෙහි මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය සහ භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය හා ප්‍රදානයෙන් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඇ) ණය සහ ප්‍රදාන ගිවිසුම් යටතේ ආපසු ගැනීම් ණය සහ ප්‍රදාන ගිවිසුම්වල නියම කරන ලද පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය සහ ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුම්වල ආරම්භක තැන්පතුව, එම ගිණුම්වලින් ආපසු ගැනිම් හා එම ගිණුම්වලට කරන ලද ඌන පූර්ණයන් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණේද යන බව.

(එ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල සඳහන් කර තිබුණු මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණේද යන බව.

**3.** **මතය**

**-----**

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 05 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණුවිට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී අග්‍රිම අරමුදල්වලින් ආපසු ගැනීම් සහ එම ගිණුම්වලට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් සහ වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල නියම කර ඇති අවශ්‍යතාවන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව.

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් කරුණු නිවැරදි කිරීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව,

(ඊ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල සඳහන් කර තිබෙන මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණු බවත්ය.

**4.** **මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**4.1** **මූල්‍ය කාර්ය සාධනය**

**------------------------**

මූල්‍ය ප්රකාශන සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතියේ වියදම රු. 1,973,186,144 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 9,265,670,955 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයයක් එක් එක් විෂය යටතේ පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 835,008,510 | 802,107,067 | 3,385,014,658 |
| උපකරණ | 235,183,099 | 423,653,045 | 2,220,950,059 |
| ලිබඩු | 57,284,091 | 42,600,440 | 282,717,548 |
| මෝටර් වාහන | - | - | 46,592,327 |
| ද්‍රව්‍ය | 22,003,587 | 83,423,127 | 371,774,838 |
| කාර්ය මණ්ඩල සංවර්ධනය | | | |
| -දේශීය පුහුණුව | 234,296,144 | 202,676,382 | 1,043,033,268 |
| -විදේශ පුහුණුව | 337,225 | 40,350,100 | 91,747,345 |
| උපදේශක සේවා | 3,308,966 | 87,683,499 | 420,373,647 |
| අධ්‍යාපන අමාත්‍යාංශය - ඇගයීම් සහ විගණනය | 20,067,284 | 12,270,906 | 37,697,648 |
| සිසු ශිෂ්‍යත්ව | 183,757,269 | 169,384,746 | 548,768,320 |
| වර්ධක පිරිවැය | 65,168,161 | 80,823,914 | 349,021,404 |
| පාසැල් සංවර්ධනය | | | |
| -මූල්‍ය ප්‍රදාන | 30,094,997 | 18,788,090 | 56,433,087 |
| -නඩත්තු ප්‍රදාන | 233,129,987 | 124,899,994 | 358,029,982 |
| ණය සේවා | 53,546,824 | - | 53,546,824 |
| එකතුව | 1,973,186,144 | 2,088,661,310 | 9,265,670,955 |

## 4.2 අග්‍රිම අරමුදල් ගිණුම

මූල්‍ය ප්‍රකාශන හා ලබාගතහැකි වූ තොරතුරු අනුව, ණය සහ ප්‍රදාන කාර්යයන් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අග්‍රිම අරමුදල් ගිණුම් දෙකක් පවත්වා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුම් මෙහෙයුම් පිළිබඳ විස්තර සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂයන් පහත පරිදි දැක්වේ.

| විස්තරය | අග්‍රිම ගිණුම් | | | |
|---|---|---|---|---|
| | ණය (එස්එල් 127) | | ප්‍රදාන (එස්එල් 128) | |
| | එජඩො | රු. | එජඩො | රු. |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 1,827,797 | 238,146,464 | 73,127 | 9,298,891 |
| <u>එකතුකළා</u> | | | | |
| ඌනපූරණයන් | 8,847,866 | 1,160,273,163 | 5,379,122 | 700,603,464 |
| විදේශ විනිමය පාඩු | - | (3,767,589) | - | (1,342,617) |

| | | | | |
|---|---|---|---|---|
| | 10,720,663 | 1,394,652,038 | 5,452,249 | 708,559,738 |
| <u>අඩුකළා</u> | | | | |
| ආපසු ගැනීම් | (5,387,830) | (697,368,155) | (4,230,742) | (548,844,044) |
| | -------------- | --------------- | -------------- | ---------------- |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 5,332,833 | 697,283,883 | 1,221,507 | 159,715,694 |
| | ======== | ========== | ======== | ========== |

## 5. විගණන නිරීක්ෂණ

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්/ඊආර්ඩී/2007/2 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය අනුව, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන ඊළඟ වර්ෂයේ මාර්තු 31 දිනට හෝ ඊට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ 2014 අගෝස්තු 09 දින දීය .

## 5.2 මූල්‍ය සහ කාර්යසාධන සමාලෝචනය

### 5.2.1 අරමුදල් උපයෝජනය

ලබාගත හැකි වූ තොරතුරු අනුව ව්‍යාපෘතියේ සංරචකවලට වෙන් කරන ලද මුදල් හා ඒ මත 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කරන ලද අරමුදල් පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| **ප්‍රභවය** | **අරමුදල් වෙන්කිරීම්** | | **2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල්** | | **උපයෝජනය ප්‍රතිශතයක් වශයෙන්** |
|---|---|---|---|---|---|
| ආසංබැ | එජඩො (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) | |
| ණය | 65.00 | 6,955.00 | 56.48 | 6,043.85 | 86.89 |
| ප්‍රදාන | 15.00 | 1,605.00 | 14.08 | 1,506.69 | 93.87 |
| ශ්‍රීලංර | 25.30 | 2,707.00 | 15.48 | 1,657.11 | 61.21 |
| එකතුව | 105.30 | 11,267.00 | 86.04 | 9,207.65 | 81.72 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව රු.මිලියන 2,045 ක් සියළුම පළාත් නවයෙහි ද්වීතියික මට්ටමේ පාසල්වලට ගොඩනැගිලි හා පරිගණක භාෂා වැඩිදියුණු කිරීම සඳහා වෙන්කර තිබුණි. කෙසේවෙතත් සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 835 ක් හෙවත් වෙන්කිරීම් වලින් සියයට 41 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ආ) 2013 වර්ෂය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව විදේශ පුහුණුව වර්ගය යටතේ රු.මිලියන 67 ක් වෙන්කරන ලද නමුත් සමාලෝචිත වර්ෂය තුළදී උපයෝජනය කර තිබුණේ වෙන්කිරීම් වලින් සියයට 4.5 ක් නියෝජනය කරමින් රු.මිලියන 3 ක් පමණි.

(ඇ) 2013 වර්ෂය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්මේ දේශීය පුහුණු කටයුතු සඳහා ණය යටතේ වෙන්කළ රු. මිලියන 113.13 ක මුදලක් සහ ප්‍රදාන යටතේ වෙන්කළ රු. මිලියන 194.40 ක මුදලින් සමාලෝචිත වර්ෂය තුළ පිළිවෙලින් රු. මිලියන 105.54 ක ණය සහ රු. මිලියන 128.76 ක ප්‍රදාන පමණක් උපයෝජනය කර තිබුණි.

(ඈ) 2013 වර්ෂය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්මේ පාසල් හැර යන්නන්ට ශිෂ්‍යත්ව ලබාදීම සඳහා වෙන්කරන ලද රු.මිලියන 383 ක ප්‍රදාන මුදල්වලින්, සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 183.76 ක ප්‍රදාන ලැබීම් උපයෝජනය කර තිබුණි.

**5.3.2 භෞතික කාර්ය සාධනය**

----------------------------

පහත නිරීකෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය සඳහා ලී බඩු සහ සවිකිරීම් ප්‍රසම්පාදනය සඳහා රු.17,600,000 ක් වෙන්කරන ලද අතර සමාලෝචිත වර්ෂය තුළදී රු.17,722,466 ක පිරිවැයක් දරමින් එකී වත්කම් සැපයුම්කරුවන් 5 දෙනෙකුගෙන් ප්‍රසම්පාදනය කර තිබුණි. කෙසේ වෙතත් එම කාර්යය සඳහා පත්කරන ලද තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් ප්‍රසම්පාදනය කරන ලද වත්කම්වල ගුණාත්මක තත්ත්වය සැලකිල්ලට නොගෙන ඒ සඳහා නිර්දේශ ලබාදී තිබුණි.

(ආ) ද්විතීයික මට්ටමේ පාසල් 1,400 ක් සංවර්ධනය හා නඩත්තු කටයුතු සඳහා මූල්‍ය සහාය සැපයීමට සැලසුම් කර තිබූ නමුත් පාසල් 1,366 කට පමණක් එම ප්‍රදානයන් සිදුකර තිබුණි. ඒ අනුව රු.284,800,000 ක් වූ මුළු ප්‍රදාන වෙන්කිරීම් වලින් එකතුව රු. 220,910,000 ක ප්‍රදාන පමණක් මුදාහැර තිබුණි. ඒ අනුව සියයට 78 ක් පමණක් 2013 දෙසැම්බර් 31 දින වන විට උපයෝජනය කර තිබුණි.

(ඇ) අදාළ වර්ෂවලදී ගෙවීම් කරනු වෙනුවට 2011 සහ 2012 වර්ෂ සඳහා "සිසුදිරිය ශිෂ්‍යත්ව වැඩ සටහන" යටතේ මූල්‍ය දුෂ්කරතා ඇති සිසුන් 1,454 දෙනෙකු සඳහා වෙන්කළ එකතුව රු.14,540,000 ක ප්‍රදාන සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. එබැවින් මූල්‍ය සහාය ලබාදීම ප්‍රමාද වීම හේතුවෙන් උසස් අධ්‍යාපනයට ඇතුළුවන මූල්‍ය දුෂ්කරතා ඇති සිසුන්ට සහායදීම සඳහා වූ ශිෂ්‍යත්ව වැඩ සටහනේ අපේක්ෂිත අරමුණ ඉටුකර ගත නොහැකි වී තිබුණි.

(ඈ) 2013 දෙසැම්බර් 31 දින දක්වා සිවිල් වැඩ යටතේ රු. මිලියන 3,385 ක් උපයෝජනය කර තිබූ නමුත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සිවිල් වැඩ සම්බන්ධයෙන් කොන්ත්‍රාත් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. එබැවින් ව්‍යාපෘතිය යටතේ කරන ලද සිවිල් කොන්ත්‍රාත් වැඩවල භෞතික ප්‍රගතිය පිළිබඳ තොරතුරු ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙන් ලබාගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ) පාසල් 27 කට ලීබඩු හා උපකරණ සවිකිරීම් සැපයීමට රු. 37,927,554 ක පිරිවැයකට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. එයින් පාසල් 16 කට සැපයූ රු.24,846,400 ක් වටිනා ලීබඩු හා උපකරණ අදාළ පාසල්වල ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ නියමිත දිනට නිමනොකිරීම නිසා 2013 දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජනය කර නොතිබුණි.

(ඊ) මහින්දෝදය තාක්ෂණික පීඨ 150 කට රු.174,900,593 ක් පිරිවැය වූ විද්‍යා හා රසායනාගාර උපකරණ සැපයීම සඳහා ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත් 03 ක් ප්‍රදානය කර තිබුණි. මෙකී උපකරණ සෘජුවම පාසල්වලට සපයා තිබූ බව නිරීක්ෂණය විය. මේ සඳහා පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පාසල් 07 කට සපයා තිබූ රු.5,551,650 ක් වටිනා උපකරණ විෂයයන් 12 ක නියැදියක් තෝරාගෙන පරීක්ෂා කිරීමේ දී එම උපකරණ නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවූ බාල වර්ගයේ උපකරණ බව අනාවරණය කරගෙන තිබුණි. කෙසේ වෙතත් තාක්ෂණික පිරිවිතරයන්ට අනුකූල නොවූ උපකරණ සඳහා කරන ලද ගෙවීම් අඩුකිරීමට පසුව ක්‍රියාකර තිබුණි. තවද රසායනාගාර සඳහා ගොඩනැගිලි ඉදිකිරීම ප්‍රමාදවීම හේතුකොට ගෙන පාසල් රැසකට සපයා තිබූ උපකරණ විධිමත් ආරක්ෂාවක් නොමැතිව පාසල් පරිශ්‍ර තුළ රඳවා තිබූ බව නිරීක්ෂණය විය.

(උ) ඉහත කරුණුවලට අමතරව මහින්දෝදය තාක්ෂණ පීඨ 150 කට ලීබඩු හා උපකරණ සැපයීම සඳහා රු. 199,285,500 ක් වටිනා කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. අදාළ පීඨ සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීමට පෙර එම කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබූ බව නිරීක්ෂණය විය. එබැවින් එම ලීබඩු හා උපකරණ විධිමත් ආරක්ෂාවක් රහිතව පාසල් පරිශ්‍ර තුළ රඳවා තිබුණි.